# කාර්ය සාධන වාර්තාව සහ ගිණුම් - 2015

## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගාල්ල

# செயற்றிட்ட அறிக்கை மற்றும் கணக்கு - 2015

## மாவட்டச் செயலகம் - காலி

# Performance Report & Accounts - 2015

## District Secretariat - Galle



# පටුන


| අනු අංකය | | විෂයය | පිටු අංකය |
|---|---|---|---|
| | | ගාල්ල දිස්ත්‍රික් ලේකම් තුමියගේ පණිවුඩය | 2 |
| 01 | | ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හැඳින්වීම | 3 |
| | | 1. දැක්ම, මෙහෙවර | 3 |
| | | 2. අරමුණු | 4 |
| | | 3. කාර්යයන් | 4 |
| | | 4. දිස්ත්‍රික් ලේකම් අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක අනුබද්ධිත කාර්යාල | 5 |
| 02 | | ගාල්ල දිස්ත්‍රික්කය හැඳින්වීම | 6-10 |
| 03 | | සංවිධාන ව්‍යුහය | 11 |
| | | 1. සංවිධාන සටහන | 12 |
| 04 | | | |
| | 4.1 | 2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට සමගාමීව කරන ලද කාර්යයන් | |
| | | 1. ව්‍යාපෘති අනුව ප්‍රතිපාදන හා සත්‍ය වියදම | 13-16 |
| | | 2. ග්‍රාම නිළධාරී කටයුතු | 16 |
| | | 3. අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රගතිය - 2015 | 16-17 |
| | | 4. විමර්ශන හා මෙහෙයුම් ඒකකයේ ප්‍රගතිය - 2015 | 17 |
| | | 5. රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම - 2015 | 17 |
| | | 6. දිස්ත්‍රික් ලේකම් විසින් රැස් කරන ලද ආදායම -2015 | 17-19 |
| | | 7. පොදු තැන්පත් ගිණුම - 2015 | 19-20 |
| | | 8. රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වල ගෙවීම් ප්‍රගතිය | 20-21 |
| | | 9. පුහුණු කිරීම් කටයුතු වල ප්‍රගතිය - 2015 | 21-25 |
| | | 10.ප්‍රාදේශීය පරිපාලනයේ කාර්යක්ෂමතාවය වැඩි කිරීම සඳහා පවත්වන ලද රැස්වීම් | 25 |
| | | 11 .හෝල් දි ගෝල් ශාලාවේ ආදායම - 2015 | 26 |
| | | 12. ඉඩම් රෙජිස්ට්‍රාර් කටයුතු වල ප්‍රගතිය - 2015 | 27 |
| | | 13. ලියාපදිංචි කිරීම් කටයුතු වල ප්‍රගතිය - 2015 | 27 |
| | | 14. හැඳුනුම්පත් නිකුත් කිරීමේ ප්‍රගතිය - 2015 | 27-28 |
| | | 15. මෝටර් රථ අංශයේ ප්‍රගතිය | 28 |
| | | 16. විශ්‍රාම වැටුප් ගෙවීමේ ප්‍රගතිය | 29 |
| | | 17. පාරිභෝගික කටයුතු ඒකකයේ ප්‍රගතිය - 2015 | 29 |
| | | 18. මිනුම් ඒකක හා ප්‍රමිති සේවා අංශයේ ප්‍රගතිය - 2015 | 29-30 |
| | | 19. ආපදා සහන සේවා කටයුතු වල ප්‍රගතිය - 2015 | 30-31 |
| | 4.2 | සමාජ සේවා සහ සංස්කෘතික වැඩ සටහන් වල ප්‍රගතිය - 2015 | |
| | | 1.සංස්කෘතික හා ආගමික කටයුතු වල ප්‍රගතිය - 2015 | 32-34 |
| | | 2.සමාජ සේවා වැඩ සටහන් වල ප්‍රගතිය - 2015 | 34-35 |
| | 4.3 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංවර්ධන කටුයුතු වල ප්‍රගතිය - 2015 | |
| | | 1 .ක්‍රම සම්පාදන අංශයේ සංවර්ධන කටයුතු වල ප්‍රගතිය | 36 |
| | | 2. කෘෂි කර්ම අංශයේ සංවර්ධන කටයුතු වල ප්‍රගතිය | 37-39 |
| | | 3. දිවි නැගුම අංශයේ සංවර්ධන කටයුතු වල ප්‍රගතිය | 40 |
| | | 4. වෘත්තීය මාර්ගෝපදේශ හා ළලදායිතා අංශයේ ප්‍රගතිය | 41 |
| | | 5. කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ ප්‍රගතිය | 41 |
| | | 6. ද්විභාෂා සහන කවුළුවේ කටයුතුවල ප්‍රගතිය - 2015 | 42 |

**ගාල්ල දිස්ත්‍රික් ලේකම් තුමියගේ පණිවුඩය**

**කාර්යක්ෂම හා ඵලදායී ජනතා මෙහෙවරක් උදෙසා....................**



දකුණු ලක අග නගරය වන ගාලු නගරය කේන්ද්‍ර කරගත් ගාල්ල දිස්ත්‍රික්කය ආර්ථික, සමාජීය, සංස්කෘතික හා ඓතිහාසික වශයෙන් සුවිශේෂී ස්ථානයක් හිමිකර ගෙන ඇත. වර්ග කිලෝ මීටර් 1,652 කින් සමන්විත ගාල්ල දිස්ත්‍රික්කයේ සිවිල් පරිපාලනයේ කේන්ද්‍රස්ථානය වන්නේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයයි. 2015 වර්ෂය සඳහා දිස්ත්‍රික්කයේ ඇස්තමේන්තු ගත ජනගහනය 1,091,000 ක් වන අතර එය සමස්ථ ශ්‍රී ලාංකීය ජනගහනයෙන් 5.2% කි. ගාල්ල දිස්ත්‍රික්කය තුළ ජීවත්වන ග්‍රාමීය ජනගහනය 85% කි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 19 කින් සමන්විත මෙම දිස්ත්‍රික්කය තුළ පිහිටි ඇත ගම් නියම්ගම් වල මෙම ජනතාව ජීවත් වන අතර කෘෂිකාර්මික අංශය ආශ්‍රිතව ජීවනෝපාය සකස් කරගෙන ඇත. ග්‍රාමීය, අර්ධ නාගරික හා නාගරික ප්‍රදේශවල ජීවත්වන සමස්ත ජනතාවගේ ආර්ථික, සමාජීය හා අධ්‍යාත්මික අවශ්‍යතාවයන් මුදුන්පත් කරලීම හා ඔවුන් ගේ ජීවන පැවැත්මට බාධා වන ගැටළු වලට සාර්ථක විසඳුම් ලබා දී ජීවන තත්ත්වය ඉහළ නැංවීමට අවශ්‍ය කටයුතු යෙදීම මාගේ ඒකායන අරමුණයි.

දිස්ත්‍රික්කය තුළ ජනතාවගේ දරිද්‍රතා මට්ටම අවම කරමින් සංවර්ධනය ඉහළ නැංවීම සඳහා 2015 වර්ෂයේ ගම් නගා සිටුවීමේ ව්‍යාපෘතිය, දොරින් දොරට ගමින් ගමට විශේෂ ව්‍යාපෘතිය, දිවි නැඟුම ආයෝජන සංවර්ධන වැඩ සටහන හා ග්‍රාමීය ප්‍රජා සෞඛ්‍ය මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමේ වැඩ සටහන් හා 2014 වර්ෂයේ අවිච්ඡේද වු සංවර්ධන ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කරන ලදී. මීට අමතරව ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීම සඳහා දිවි නැගුම සහනාධාර වැඩසටහන, පෝෂණ සහනාධාර, ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන (CBR), ආබාධිත ප්‍රජාව සඳහා ආධාර ලබා දීම, වැඩිහිටි ප්‍රජාව සඳහා මාසික දීමනා, ගර්භනී මවුවරු සඳහා පෝෂණ මල්ල වැඩසටහන සහ පෙර පාසල් දරුවන් සඳහා කිරි වීදුරුව වැනි වැඩසටහන් ද ක්‍රියාත්මක කරන ලදී. එසේම දිස්ත්‍රික්කයේ ප්‍රජාව සඳහා වූ ආපදා සහන වැඩසටහන් මෙන්ම දේශීය කෘෂිකර්මාන්තය සඳහා වාණිජ ගොවිපළවල් ඇති කිරීමේ වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදී. එසේම සමාජ සංවර්ධනය උදෙසා මත් නිවාරණ ජාතික වැඩසටහන ද දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කෙරිණි.

නවීන තාක්ෂණික උපක්‍රම ඔස්සේ පොදු ජන අවශ්‍යතාවයන් ඉතාම ඉක්මනින් ඉටු කර දීම සඳහා මාගේ කාර්ය මණ්ඩලය ඉමහත් කැපවීමකින් කටයුතු කරයි. ඉදිරියේදී ද ගාල්ල දිස්ත්‍රික්කයේ ජනතාවගේ අවශ්‍යතා ඉටු කරමින් දිස්ත්‍රික්කයේ සංවර්ධනය සඳහා උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව කටයුතු කරන අතර ප්‍රාදේශීය පරිපාලනය ජනතාවට ගෙන යාම සඳහා ඉමහත් ධෛර්යයකින් යුතුව දායකත්වය ලබා දෙන මාගේ ප්‍රාදේශීය ලේකම්වරුන් ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලයටත්, මා හට අවශ්‍ය සහාය ලබාදෙමින් කටයුතු කරන මෙම කාර්යාලයේ සියළුම නිලධාරීන්ටත් මාගේ ගෞරවනීය ස්තූතිය පිරිනමමි.

මාලනී ලොකුපෝතාගම
දිස්ත්‍රික් ලේකම්/ දිසාපති (වැ.බ.)
ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කය.

# 1. ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හැඳින්වීම

ගාල්ල දිස්ත්‍රික්කයේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 හි ප්‍රාදේශීය පරිපාලන කටයුතු සම්බන්ධීකරණය කිරීමේ කේන්ද්‍රස්ථානය වන්නේ ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයයි. දකුණු පළාතේ අග නගරය වන ගාල්ල නගරය වර්තමානය වන විට ඉතා ජනප්‍රිය මෙන්ම ජනාකීර්ණ නගරයක් බවට පත් ව ඇති අතර වේගයෙන් සංවර්ධනය වන නගරයකි. 2015 වර්ෂය සඳහා ඇස්තමේන්තු කර ඇති ආකාරයට 1,091,000 ක ජනගහනයක් මෙහි ජීවත් වන අතර ඔවුන් ගේ ආර්ථික, සමාජීය හා සංස්කෘතික අවශ්‍යතාවයන් හඳුනා ගෙන ඒවා සඳහා විසඳුම් ලබා දීමේ සම්බන්ධීකරණ වැඩ පිළිවෙල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ඉටු කරනු ලබයි.

රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ සේවා සපයන ආයතන සහ නිෂ්පාදන ආයතන ලෙස කටයුතු කරන සුවිසල් ගොඩනැඟිලි රාශියක් මධ්‍යයේ ගාල්ල දිස්ත්‍රික්කයේ හදවත බඳු වූ ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ගාල්ල නගරය අරා විරාජමාන වී සිටී. ගාල්ල කොළඹ ප්‍රධාන මාර්ගයේ ගාල්ල ප්‍රධාන බස් නැවතුම්පොළට හා ගාල්ල ප්‍රධාන දුම්රිය ස්ථානයට සමීපාසන්නව ම නවීන පන්නයේ සත් මහල් ප්‍රාසාදයක මෙම කාර්යාලය ස්ථාන ගත කර ඇත. මහජනතාවට තම සේවා අවශ්‍යතාවයන් සැණින් සපුරා ගත හැකි ලෙස ඉතා පහසුවෙන් ප්‍රවේශ විය හැකි ස්ථානයක් මෙන්ම නවීන තාක්ෂණය අනුව කටයුතු කරමින් ඉක්මණින් මහජන අවශ්‍යාතාවයන් සපුරාදෙන ඉතා සුව පහසු දැකුම්කළු සේවා ආයතනයක් ලෙසද මෙය හැඳින්විය හැකිය. මහජනතාවට සඵලදායී කාර්යක්ෂම සේවාවන් රැසක් එකම වහළක් යටින් ලබා දීමේ ඒකායන අරමුණින් මධ්‍යම රජයේ සහ පළාත් රාජ්‍ය සේවයේ ආයතන රාශියක් මෙම දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය තුළ ස්ථාන ගත කර ඇත.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුළින් මහජනතාවට ලබා දෙන සේවාවන් සහ එම සේවාව ලබා දීමට ගත වන කාලය සඳහන් කරමින් සකසන ලද සේවාලාභී ප්‍රඥප්තිය කාර්යාල පරිශ්‍රයේ බිම් මහලේ ප්‍රදර්ශනය කර ඇත. නූතන පරිගණක තාක්ෂණයභාවිතා කරමින් වේගයෙන් කටයුතු කරන බැවින් සෑම නිළධාරියෙක්ම එම ප්‍රඥප්තියෙහි සඳහන් කාල පරාසය තුළ ම තම සේවාව ඉටු කර දීමට බොහෝ සෙයින් උත්සුක වේ.

ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වර්තමාන වැඩ බලන දිස්ත්‍රික් ලේකම් ලෙස කටයුතු කරනු ලබන්නේ මාලනී ලොකුපෝතාගම මැතිණියයි. 1948 ආරම්භයේ සිට මේ දක්වා ආණ්ඩුවේ ඒජන්තවරුන්/ දිසාපතිවරුන්/ දිස්ත්‍රික් ලේකම්වරුන් 24 ක් මෙහි කටයුතු කර ඇති අතර 2015 වර්ෂයේ සිට වත්මන් වැඩ බලන දිස්ත්‍රික් ලේකම් ලෙස මාලනී ලොකුපෝතාගම මැතිණිය කටයුතු කරනු ලබයි.

1.1 **දැක්ම :-**

ගාල්ල දිස්ත්‍රික්කයේ ජනතාව සඳහා විශිෂ්ට රාජ්‍ය සේවාවක් ලබා දීම.

**මෙහෙවර :-**

නිපුනතාවයෙන් හෙබි මානව සම්පත් උපයෝජනය සහිත දිස්ත්‍රික් මට්ටමේ උසස් පරිපාලන ක්‍රමයක් තුළින් විශිෂ්ට රාජ්‍ය සේවාවක් තහවුරු කිරීම.

## 1. 2 අරමුණු :-

1. දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන විවිධ දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල හා අධිකාරීන් මඟින් ක්‍රියාත්මක කරනු ලබන දේශීය හා විදේශීය අරමුදල් මඟින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති හා වැඩ සටහන් සංවිධානය කිරීම, මූල්‍යමය සහ මූල්‍යමය නොවන සම්පත් යෙදවීම සහ පසු විපරම් කටයුතු වල සම්බන්ධීකාරකයා ලෙස ක්‍රියා කරමින් දිස්ත්‍රික්කයේ ජනතාවගේ සුභසාධනය සහ සංවර්ධනය ඉහළ නැංවීම.

2. කාර්යක්ෂම හා ඵලදායී දිස්ත්‍රික් පරිපාලන පද්ධතියක් පවත්වාගෙන යාම තුළින් දිස්ත්‍රික් බල ප්‍රදේශය තුළ වෙසෙන ජනතාවගේ විවිධ වූ ආර්ථික, සමාජ හා සංස්කෘතිකමය අවශ්‍යතාවයන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඔස්සේ ඉටු කර දීම.

3. දිස්ත්‍රික්කයේ රජයේ නියෝජිතයා වශයෙන් ක්‍රියා කරමින් විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන වලට නිවැරදි තීරණ ගැනීම සඳහා අවශ්‍ය නිවැරදි සහ නිශ්චිත තොරතුරු ග්‍රාමීය හා ප්‍රාදේශීය මට්ටමින් එක් රැස් කර ඒකාබද්ධ කර සපයා දීම.

4. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඔස්සේ රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙනුවෙන් දිස්ත්‍රික්කය තුළ ඔවුන්ට හිමි ආදායම් එක් රැස් කිරීම, ගිණුම් ගත කිරීම, භාණ්ඩාගාරය වෙත නිවේදනය කිරීම.

5. ගංවතුර, සුළි සුළං, නියඟ, මුහුද ගොඩ ගැලීම් වැනි විස්තීර්ණ ආපදා අවස්ථා වල දී ජනතාවට අවශ්‍ය ක්ෂණික සහන සේවාවන් සහ ආධාර ලබා දී ඔවුන්ගේ ජීවන තත්වය යථා තත්වයට පත් කිරීම.

## 1.3 කාර්යයන් :-

1.ජාතික මට්ටමේ හා දිස්ත්‍රික් මට්ටමේ සංස්කෘතික, ආගමික හා වෙනත් කාලීන රාජ්‍ය උත්සව සංවිධානය කිරීමේ ප්‍රධානියා ලෙස ක්‍රියා කිරීම.

2. සියළුම මැතිවරණ කටයුතු එනම් ජනාධිපතිවරණය, පාර්ලිමේන්තු මැතිවරණය, පළාත් සභා මැතිවරණය හා පළාත් පාලන මැතිවරණ වල දී දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරී ලෙස ක්‍රියා කරමින් සාධාරණ හා අපක්ෂපාතී මැතිවරණ පැවැත්වීමට ක්‍රියා කිරීම.

3. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව, දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ ලේකම් වශයෙන් ක්‍රියා කරමින් දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු සැලසුම් කිරීම, සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම හා පසු විපරම් කිරීම.

4. දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය ලේකම්වරුන් 19 දෙනා සමඟ ප්‍රාදේශීය පරිපාලන කටයුතු මෙහෙයවීමේ ප්‍රධානියා ලෙස ක්‍රියා කිරීම.

5. විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සම්බන්ධ ආදායම් ගණන් දීමේ නිලධාරීන් වෙනුවෙන් ඔවුන්ගේ ආදායම් එක් රැස් කිරීම, ගිණුම් ගත කිරීම, භාණ්ඩාගාරයට වාර්තා කිරීම හා අදාළ ආදායම් ගණන් දීමේ නිලධාරීන් දැනුවත් කිරීම.

6. දිස්ත්‍රික් බල ප්‍රදේශය තුළ සියළුම රාජ්‍ය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වල නියෝජ්‍ය ප්‍රධානියා ලෙස ක්‍රියා කරමින් ඒ ඒ දෙපාර්තමේන්තු වල අරමුණු, පරමාර්ථ හා කාර්යයන් ඉටු වන පරිදි සම්බන්ධීකරණ කටයුතු කිරීම.

7. නියඟ, ගං වතුර, සුළි සුළං, මුහුද ගොඩ ගැලීම් වැනි විස්තීර්ණ ආපදා අවස්ථාවන්හිදි රජයේ නියෝජිතයා ලෙස ක්‍රියා කරමින් ආපදා කළමනාකරණ කටයුතු සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා පසු විපරම් කටයුතු කිරීම තුලින් ජන ජීවිතය යථා තත්වයට පත් කිරීම හා ස්ථාවර කිරීම.

8. දිස්ත්‍රික්කය තුළ ඉඩම් ඔප්පු, උප්පැන්න, මරණ සහ විවාහ ලියාපදිංචි කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම.

9. දිස්ත්‍රික්කය තුළ විශ්‍රාම වැටුප් කටයුතු සම්බන්ධීකරණය කිරීම.

## 1.4 දිස්ත්‍රික් ලේකම් අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන අනුබද්ධිත කාර්යාල

1. දිස්ත්‍රික් දිවි නැගුම කාර්යාලය
2. දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය
3. සංඛ්‍යාලේඛන අංශය
4. දිස්ත්‍රික් කෘෂිකර්ම අංශය
5. කුඩාව්‍යාපාර සංවර්ධන අංශය
6. මිණුම් ඒකක ප්‍රමිති හා සේවා අංශය
7. ක්‍රීඩා ඒකකය
8. පාරිභෝගික සේවා අධිකාරී ඒකකය
9. මෝටර් රථ ප්‍රවාහන අංශය
10. දිස්ත්‍රික් ළමා කාන්තා හා සමාජ සංවර්ධන ඒකකය - එකමුතු පියස
11. මාධ්‍ය හා ප්‍රවෘත්ති අංශය
12. වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය
13. ඵලදායීතා ප්‍රවර්ධන ඒකකය
14. දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකය
15. පරිසර ඒකකය
16. ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා ඒකකය
17. මාධ්‍ය ඒකකය
18. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ගාල්ල කඩවත් සතර
19. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - තවලම
20. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - නියාගම
21. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - අම්බලන්ගොඩ
22. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කරන්දෙණිය
23. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ඇල්පිටිය
24. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - නෙළුව
25. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - නාගොඩ
26. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - බලපිටිය
27. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - හික්කඩුව
28. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - අක්මීමණ
29. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - බෙන්තොට
30. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - හබරාදූව
31. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - බද්දේගම
32. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - යක්කලමුල්ල
33. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - බෝපේ පෝද්දල
34. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - වැලිවිටිය දිවිතුර
35. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ඉමදූව
36. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ගෝනපීනුවල



## 02. ගාල්ල දිස්ත්‍රික්කය හැඳින්වීම

දකුණු පළාතේ අග නගරය ලෙස හැඳින්වෙන ගාල්ල දිස්ත්‍රික්කය උතුරින් කළුතර හා රත්නපුර දිස්ත්‍රික්ක වලින් ද නැගෙනහිරින් මාතර දිස්ත්‍රික්කයෙන් ද බටහිරින් ඉන්දියන් සාගරයෙන්ද මායිම් වන පරිදි වර්ග කි.මී.1651.6 ක භූමි ප්‍රදේශයක් පුරා විහිදී ඇත. මින් ගොඩබිම් ප්‍රමාණය වර්ග කි.මී. 1635.6 ක් වන අතර වර්ග කි.මී. 16 ක් අභ්‍යන්තර ජලාශ වලින් නිර්මාණය වී ඇත. උතුරු අක්ෂාංශ $5.97^{0}$– $6.44^{0}$ ක් නැගෙනහිර දේශාංශ $79.99^{0}$ – $80.49^{0}$ අතර ගාල්ල දිස්ත්‍රික්කය පිහිටා ඇත.

ගාල්ල දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ නිරිත දිග ප්‍රදේශයට අයත් වුව ද, භූ විෂමතාවය හා වර්ෂාපතනය අනුව පහත රට තෙත් කලාපයට අයත් වේ . වාර්ෂික වර්ෂාපතනය අඟල් 80 – 160 වන අතර , සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය $75F^{0}$ ක් පමණ වේ. වසරේ මැයි සිට සැප්තැම්බර් දක්වා නිරිත දිග මෝසම් වැස්ස මගින් අධික වර්ෂාපතනයක් දක්නට ලැබේ. මෙයට අමතරව සංවහන හා වාසුළි මගින් ද වැසි ලැබේ.

ගාල්ල දිස්ත්‍රික්කයට අයත් ප්‍රධාන ගංගාව ගිං ගඟ වේ. මීට අමතරව බෙන්තොට ගඟ, මාදු ගඟ, කොග්ගල ඔය වැනි කුඩා ගංගා ද දැකිය හැකිය. මෙහි ඇති ප්‍රධාන කඳු ලෙස කබරගල කන්ද, කොන්දගල කන්ද, කැකිරිහේන කන්ද, වාඩියහේන කන්ද, හිනිදුම කන්ද, තිබ්බොටුවාව කන්ද හා බලගල යනාදී කඳු පෙන්වා දිය හැකිය. ස්වභාව ධර්මයේ අපූර්ව නිර්මාණ වන කඩොලාන ශාක වලින් යුත් වගුරු බිම් හා කලපු වෙරළාසන්න කලාපය පුරාම දැකිය හැකිය.

දකුණු පළාතේ අග නගරය වන ගාල්ල නගරය ඉතා පෞරාණික එමෙන්ම ඓතිහාසික නගරයකි. ශ්‍රී ලාංකීය සාහිත්‍ය කලාවේ ස්වර්ණමය යුගය වශයෙන් සැලකෙන කෝට්ටේ යුගයේ රචිත, මයුර, තිසර, පරෙවි, කෝකිල ආදී සංදේශ කාව්‍ය කිහිපයකම ගාල්ල නගරය අතිශය වර්ණනාවට පාත්‍ර කර තිබීමෙන් පෙනී යන්නේ මෙය ඓතිහාසික වශයෙන් පමණක් නොව සාහිත්‍ය වශයෙන්ද අනගි නගරයක් බවයි. ඈත අතීතයේ ගාල්ල නගරය විදේශිකයන් අතර පවා ප්‍රසිද්ධියට පත්වූයේ මෙහි ඇති ස්වාභාවික වරාය නිසාවෙනි. ක්‍රි. ව. 1587 දී පෘතුගීසීන් විසින් ගාල්ල නගරය අත්පත් කර ගත් අතර ක්‍රි. ව. 1619 දී තාප්පයක් බඳවා ඇත. ඉන් පසු ලන්දේසීන් විසින් ගාල්ල අත්පත් කර ගැනීමෙන් පසු ගාල්ල කොටුව විශාල කරනු ලැබීය. ලෝක උරුමයක් වශයෙන් ගාලු කොටුව යුනෙස්කෝව විසින් නම් කර ඇත.

දෙස් විදෙස් සංචාරකයින්ට දැක බලා රස විඳිය හැකි විශේෂ ස්ථාන රාශියක් ම ගාල්ල දිස්ත්‍රික්කය පුරා විසිරී ඇත. ලන්දේසි බලකොටුව හා කොටු පවුර, රූමස්සල කඳු වැටිය, සිංහරාජ වනාන්තරය, කන්නැළිය රක්ෂිතය හා දූවිලි ඇල්ල, මාදු ගඟ ආශ්‍රිත කුඩා දූපත්, මඩොල්දූව සහ මාර්ටින් වික්‍රමසිංහ කෞතුකාගාරය, සීනිගම හා වැල්ලේ දේවාල පුද බිම්, ගාල්ල ප්‍රදීපාගාරය හා සමුද්‍ර කෞතුකාගාරය ආදිය දැක්විය හැක.

ශ්‍රී ලංකාවේ ජාතික ආදායමට ගාල්ල දිස්ත්‍රික්කයෙන් සැලකිය යුතු දායකත්වයක් ලබා දේ. එය කෘෂිකාර්මික, කර්මාන්ත හා සංචාරක යන ක්ෂේත්‍රයන්ගෙන් සපයනු ලැබේ. කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ වී, තේ, රබර්, පොල්, කුරුඳු වැනි භෝග ප්‍රධාන තැනක් ගනී.

<u>**ගාල්ල දිස්ත්‍රික් කෘෂිකාර්මික භෝග වගාව (හෙක්ටයාර වලින්)**</u>

| | |
|---|---|
| වී (මහ කන්නය) | 13,129.80 |
| තේ | 27,427.00 |
| රබර් | 6,679.30 |
| පොල් | 2,548.00 |
| කුරුඳු | 12,110.00 |
| කෝපි | 64.00 |
| ගම්මිරිස් | 795.00 |
| කජු | 28.00 |
| කරාබු | 34.00 |
| බුලත් | 148.00 |




ගාලු නගරයට කි.මී.10 ක් පමණ දුරින් කොග්ගල ඇඟළුම් අපනයන කලාපය පිහිටුවා ඇති අතර ඉන් ගාල්ල දිස්ත්‍රික්කයේ තරුණ තරුණියන් විශාල පිරිසකට රැකියා පහසුකම් සැලසී ඇත. තවද බෙන්තොට, අම්බලන්ගොඩ, හික්කඩුව, ගාල්ල, උණවටුන වෙරළ කලාපය ආශ්‍රිතව පවත්වාගෙන යන සංචාරක ව්‍යාපාරය හේතුකොටගෙන මෙහි ජනතාවගේ ආදායම් උත්පාදන මාර්ග වැඩි දියුණු වී ඇත. පාරම්පරික නිර්මාණ අතර බීරළු රේන්ද, කැටයම් කලාව (අලි කැපීම) , වෙස් මුහුණු සහ රුකඩ ගාල්ල දිස්ත්‍රික්කයට ආවේණික කර්මාන්ත වේ.

මාතර කොළඹ අධිවේගී මාර්ගය නිසා රටේ සමස්ථ ජාතික ආර්ථික සංවර්ධනයට ගාල්ල දිස්ත්‍රික්කයේ දායකත්වය තවත් වැඩි දියුණු කිරීමට හේතු වී ඇත. එමෙන්ම සංචාරක ව්‍යාපාරයට සහ ගාල්ල වරාය කටයුතු වලට ද මෙය විශාල පිටු බලයක් වී ඇත.

ගාල්ල දිස්ත්‍රික්කයේ වාරි මාර්ග පද්ධතිය වැව් 04 කින් අමුණු 504 කින් සහ ප්‍රධාන නළ මාර්ග 117 කින් සමන්විත වී ඇත. මෙම වාරි මාර්ග පද්ධතිය පාලනය කිරීම හා නඩත්තු කිරීම සිදු කරනු ලබන්නේ ප්‍රධාන රාජ්‍ය ආයතන 03 ක මැදිහත් වීමෙනි.

1. වාරි මාර්ග දෙපාර්තමේන්තුව
2. පළාත් වාරි මාර්ග දෙපාර්තමේන්තුව
3. ගොවි ජන සංවර්ධන දෙපාර්තමේන්තුව

2015 වර්ෂය සඳහා ඇස්තමේන්තු ජනගහනය 1,091,000 ක් වන අතර පුරුෂ ජනගහනය 523,169 (48%) ක් ද ස්ත්‍රී ජනගහනය 567,831 (52%) වේ. ගාල්ල දිස්ත්‍රික්කයේ ජනගහනයෙන් වැඩි ප්‍රමාණයක් ජීවත් වන්නේ ග්‍රාමීය අංශයේය. එය 85.6% ක් පමණ වේ. නාගරික අංශය 12.5% ක් සහ වතු අංශය 1.9% ක් ද නියෝජනය කරයි.

2012 වසරේදී පවත්වන ලද ජන හා නිවාස සංගණනයට අනුව ගාල්ල දිස්ත්‍රික්කයේ ජනගහනය 1,063,334 ක් වූ අතර එය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව සහ ස්ත්‍රී පුරුෂ අනුව බෙදී ඇති ආකාරය පහත සඳහන් පරිදි දැක්විය හැක.

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
|---|---|---|---|
| බෙන්තොට | 51,275 | 24,711 | 26,565 |
| බලපිටිය | 69,186 | 32,809 | 36,377 |
| කරන්දෙණිය | 64,124 | 30,960 | 33,164 |
| ඇල්පිටිය | 66,410 | 31,876 | 34,534 |
| නියාගම | 36,500 | 17,729 | 18,771 |
| තවලම | 33,457 | 16,372 | 17,085 |
| නෙළුව | 29,385 | 14,769 | 141,617 |
| නාගොඩ | 55,230 | 26,611 | 28,619 |
| බද්දේගම | 76,960 | 36,687 | 40,272 |
| වැලිවිටිය | 30,111 | 14,352 | 15,759 |
| අම්බලන්ගොඩ | 58,443 | 28,012 | 30,431 |
| හික්කඩුව | 104,560 | 50,382 | 54,179 |
| කඩවත් සතර | 104,396 | 50,066 | 54,331 |
| බෝපේ පෝද්දල | 51,641 | 24,484 | 27,157 |
| අක්මීමන | 79,800 | 37,866 | 41,933 |
| යක්කලමුල්ල | 47,141 | 22,750 | 24,392 |
| ඉමදූව | 46,048 | 21,843 | 24,205 |
| හබරාදූව | 64,012 | 30,363 | 33,649 |
| ගෝනාපිනූවල | 22,321 | 10,528 | 11,793 |

ගාල්ල දිස්ත්‍රික්කයේ ජන ඝණත්වය (හෙක්ටයාර 1 කට පුද්ගල සංඛ්‍යාව) 660.41 කි.අඩුම ජන ඝණත්වය වාර්තා වන්නේ තවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වන අතර එය 187.96 කි. වැඩිම ජන ඝණත්වය 4349.85 ක් වන අතර එය වාර්තා වන්නේ කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වේ.

| මාසය | වර්ෂාපතනය (මි.මී.) | ආර්ද්‍රතාවය% | | උෂ්ණත්වය ($C^0$) | |
|---|---|---|---|---|---|
| | | දිවා | රාත්‍රී | උපරිම | අවම |
| ජනවාරි | 68.3 | 79.2 | 87.0 | 29.5 | 24.0 |
| පෙබරවාරි | 114.8 | 78.1 | 87.5 | 29.6 | 23.5 |
| මාර්තු | 138.2 | 73.0 | 86.5 | 31.7 | 24.2 |
| අප්‍රේල් | 171.3 | 76.6 | 87.0 | 31.1 | 25.0 |
| මැයි | 282.1 | 82.1 | 86.9 | 30.5 | 25.8 |
| ජූනි | 160.2 | 81.4 | 84.6 | 30.3 | 26.2 |
| ජූලි | 249.2 | 83.0 | 86.6 | 29.5 | 25.7 |
| අගෝස්තු | 153.3 | 82.4 | 85.5 | 29.7 | 25.7 |
| සැප්තැම්බර් | 474.1 | 83.9 | 87.7 | 29.5 | 25.2 |
| ඔක්තෝබර් | 316.1 | 82.3 | 89.4 | 29.9 | 24.6 |
| නොවැම්බර් | 354.1 | 80.5 | 90.1 | 30.0 | 24.4 |
| දෙසැම්බර් | 95.5 | 79.4 | 88.6 | 30.8 | 24.3 |

ගාල්ල දිස්ත්‍රික්කයේ දේශගුණික තත්වය දෙස බලන විට 2015 වර්ෂයේ පැවති සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක 27.5 ක් පමණ වේ. වාර්ෂික වර්ෂාපතනය මි.මී. 68.3 – 474.1 වේ. මෙම වර්ෂය තුළ වැඩිම වර්ෂාපතනයක් වාර්තා වි ඇත්තේ සැප්තැම්බර් මාසයෙනි. ඒ මිලි මීටර් 474.1 ක් ලෙසිනි. අඩුම වර්ෂාපතනය ජනවාරි මස මිලි මීටර් 68.3 වේ.


ගාල්ල දිස්ත්‍රික්කයේ පරිපාලන සිතියම
N
W
E
S
බෙන්තොට
බලපිටිය
කරන්දෙනිය
ඇල්පිටිය
නියාගම
නෙළුව
තවලම
අම්බලන්ගොඩ
වැලිවිටිය දිවිතුර
නාගොඩ
ගෝනපීනුවල
බද්දේගම
හික්කඩුව
යක්කලමුල්ල
බෝපේ
පෝද්දල
කඩවත්සතර
අක්මීමන
ඉමදූව
හබරාදූව
8000
0
8000
16000

## දිස්ත්‍රික්කයේ මූලික සංඛ්‍යාලේඛන තොරතුරු - (2015)

| | | |
|---|---|---|
| • දිස්ත්‍රික්කයේ නම | : | ගාල්ල දිස්ත්‍රික්කය |
| • පළාත | : | දකුණු පළාත |
| • මුළු භූමි ප්‍රමාණය | : | 1652km$^2$ |
| • ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගණන | : | 19 |
| • ග්‍රාම නිලධාරී කොට්ඨාස ගණන | : | 896 |
| • ගම්මාන සංඛ්‍යාව | : | 2,446 |
| • මුළු ඡන්දදායකයින් ගණන | : | 833,887 |
| • ඡන්ද කොට්ඨාස ගණන | : | 703 |
| • මහ නගර සභා ගණන | : | 01 |
| • නගර සභා ගණන | : | 02 |
| • ප්‍රාදේශීය සභා ගණන | : | 17 |
| • සංචාරක නිවාස ගණන (ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති) | : | 02 |
| • රජයේ නිවාස ගණන (ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති) | : | 62 |
| • කලාප අධ්‍යාපන කාර්යාල ගණන | : | 04 |

| කලාපය | පාසල් ගණන | ගුරු සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව | විදුහල් පතිවරු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ගාල්ල | 145 | 5026 | 101774 | 145 |
| අම්බලන්ගොඩ | 83 | 2070 | 48030 | 83 |
| ඇල්පිටිය | 124 | 2396 | 46441 | 124 |
| උඩුගම | 79 | 1585 | 27392 | 79 |
| **මුළු එකතුව** | **431** | **11077** | **223637** | **431** |

| | | |
|---|---|---|
| ❖ පාසල් ගණන | : | 431 |
| ❖ ගුරුවරු ගණන | : | 11,077 |
| ❖ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ගණන | : | 10 |
| ❖ පළාත් සභා මන්ත්‍රීවරු ගණන | : | 22 |
| ❖ පළාත් පාලන ආයතන ගණන | : | 20 |
| ❖ පළාත් පාලන ආයතන සභිකයන් ගණන | : | 244 |
| ❖ දිස්ත්‍රික්කයේ ජනගහනය | | |
| (2012 වර්ෂයේ සංගණනයට අනුව) | : | 1,063,334 |
| (2015 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ජනගහනය) | : | 1,091,000 |

## 03. සංවිධාන ව්‍යුහය.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අරමුණු මුදුන් පමුණුවා ගත හැකි ආකාරයට වගකීම් හා කාර්යයන් නිසි අයුරින් ඉටු කිරීමට හැකි වන පරිදි 261 වැය ශීර්ෂය යටතේ මෙහෙයුම් වැඩසටහන ක්‍රියාත්මක වේ. එය ව්‍යාපෘති 2 කින් යුක්ත වේ.

ව්‍යාපෘතිය 1 - සාමාන්‍ය පරිපාලනය හා ආයතන සේවා - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය.

ව්‍යාපෘතිය 2 - ප්‍රාදේශීය ලේකම් කාර්යාල

## 3.1 සංවිධාන සටහන

දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය සංවිධාන සටහන සකස් කිරීමේ දී 261 ගාල්ල දිස්ත්‍රික් ලේකම්ගේ වැය ශීර්ෂයෙන් වැටුප් ලබන කාර්ය මණ්ඩලය පමණක් නොව දිස්ත්‍රික් ලේකම්ගේ අධීක්ෂණය යටතේ ඇති වෙනත් දෙපාර්තමේන්තු හා රේඛීය අමාත්‍යාංශ වල කාර්ය මණ්ඩලය ද ඇතුළත් කර ඇත.

# සංවිධාන සටහන - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගාල්ල



## කාර්ය මණ්ඩල විස්තර

ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඊට අනුබද්ධ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 හි අනුමත කාර්ය මණ්ඩලය, දැනට සේවයේ නියුක්ත කාර්ය මණ්ඩලය පහත සඳහන් පරිදිය.

| කාණ්ඩය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | | ප්‍රාදේශීය ලේකම් කාර්යාල | |
|---|---|---|---|---|
| | අනුමත සේවක සංඛ්‍යාව | සත්‍ය සේවක සංඛ්‍යාව | අනුමත සේවක සංඛ්‍යාව | සත්‍ය සේවක සංඛ්‍යාව |
| ජ්‍යෙෂ්ඨ මට්ටම - ස්ථිර | 8 | 7 | 57 | 51 |
| තෘතීය මට්ටම - ස්ථිර | 1 | 2 | 43 | 19 |
| ද්විතීය මට්ටම - ස්ථිර | 38 | 37 | 1,486 | 1,449 |
| ප්‍රාථමික මට්ටම - ස්ථිර ආදේශක | 17 | 20 | 155 | 152 |
| එකතුව | **64** | **66** | **1,741** | **1,671** |

## 04.දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සාමාන්‍ය පරිපාලනය

### 4.1 2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට සමගාමීව කරන ලද කාර්යයන්

### 4.1.1. ව්‍යාපෘති අනුව ප්‍රතිපාදන හා සත්‍ය වියදම

2015වර්ෂය සඳහා ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හා ඒ යටතේ ක්‍රියාත්මක වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 සඳහා ලැබී ඇති මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මි.1,120.3 කි. මෙයින් ව්‍යාපෘති 01 සඳහා රු.මි.175.7 ක් සහ ව්‍යාපෘති 02 සඳහා රු.මි.944.6 ක් ද වෙන් කර ඇත. ව්‍යාපෘති 01 සහ 02 හි වියදම වෙන් වෙන් වශයෙන් පහත සඳහන් පරිදිය.

**<u>පුනරාවර්තනවියදමේසංයුතිය - 2015 වර්ෂයව්‍යාපෘතිය 01</u>**
**<u>දිස්ත්‍රික් ලේකම්කාර්යාලයගාල්ල</u>**

| වැයවිස්තරය | සත්‍යවියදමරු. |
|---|---:|
| පුද්ගලපඩිනඩි | 74,643,591 |
| ගමන්වියදම් | 493,933 |
| සැපයීම් | 3,180,941 |
| නඩත්තුවියදම් | 3,049,882 |
| සේවා | 13,976,878 |
| මාරුකිරීම් | 2,459,167 |
| **එකතුව** | **97,804,392** |



## ප්‍රාග්ධන වියදමේ සංයුතිය - 2015 වර්ෂය
## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල

| වැයවිස්තරය | සත්‍යවියදම රු. |
|---|---|
| මූල ධනවත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණුකිරීම් | 8,475,248 |
| මූල ධනවත්කම් අත්පත් කරගැනීම | 37,181,936 |
| පුහුණුකිරීම්හාහැකියාවර්ධනය | 1,624,038 |
| **එකතුව** | **47,281,223** |




ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 හි ගොඩනැගිලි නඩත්තු සඳහා වැය විෂය 261-1-1-0-2001 යටතේ ලැබී තිබූ ශුද්ධ ප්‍රතිපාදනය රු.5,250,000.00 කි. 2015 ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කරමින් 2 වන කාර්තුව වන විට 8 % ක ද 3 වන කාර්තුව වන විට 32% ක ප්‍රගතියක් ද ලබා ගත් අතර අවසාන කාර්තුව වන විට 99.5% ක මූල්‍ය ප්‍රගතියක් ලබා ගෙන ඇත.

වැය ශීර්ෂ 261-1-1-0-2002 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා සඳහා රු.1,750,000.00 ක ප්‍රතිපාදනයක් ලැබී තිබුනි. 2015 ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කරමින් 2 වන කාර්තුව වන විට 6.9% ක ද 3 වන කාර්තුව වන විට 32% ක ද ප්‍රගතියක් හිමි කර ගෙන තිබූ අතර 4 වන කාර්තුව වන විට 99 % ක මූල්‍ය ප්‍රගතියක් අත් කර ගැනීමට සමත් වී ඇත.

වැය ශීර්ෂ 261-1-1-0-2003 වැය ශීර්ෂය යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල වාහන සඳහා 2015 වර්ෂයට රු.1,750,000.00 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර ක්‍රියාකාරී සැලැස්මට අනුව 1 වන කාර්තුවේ දී 9.8% ක් ද 2 වන කාර්තුව වන විට 14.9% ක් ද 3 වන කාර්තුව වන විට 14.9% ක් හා 4 වන කාර්තුව වන විට 100% ක් වැය කිරීමට සැලසුම් කර තිබුන ද දෙවන කාර්තුව වන විට 14.9% ක ද තුන්වන කාර්තුව වන විට 14.9% ක ද ප්‍රගතියක් හිමි කර ගනිමින් හතරවන කාර්තුව වන විට 86 % ක මූල්‍ය ප්‍රගතියක් ලබා ගෙන ඇත.

වැය ශීර්ෂ 261-1-1-0-2102 ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ සඳහා රු. 5,500,000.00 ක ප්‍රතිපාදන ලැබී තිබුනි. 2015 ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කරමින් දෙවන කාර්තුව වන විට 53.8% කුත්, තුන්වන කාර්තුව වන විට74.6% හා හතරවන කාර්තුව වන විට 99.7% කුත් වැය කරමින් වර්ෂය අවසානයේදී 100% ක මූල්‍ය ප්‍රගතියක් අත් කර ගෙන ඇත.

වැය ශීර්ෂ 261-1-1-0-2103 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අත් පත් කර ගැනීම් සඳහා ලැබී තිබූ ශුද්ධ ප්‍රතිපාදනය රු. 1,750,000.00 ක ප්‍රතිපාදනය 2015 ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු කරමින් 2 වන කාර්තුව වන විට 14.6% කුත්, තුන්වන කාර්තුව වන විට 44.3% ක් වැය කරමින් වර්ෂය අවසානෙය්දී 98.6% ක මූල්‍ය ප්‍රගතියක් ලබා ඇත.

වැය ශීර්ෂ 261-1-1-0-2104 ගොඩනැගිලි සහ ඉදි කිරීම් සඳහා ශුද්ධ ප්‍රතිපාදනය රු. 60,000,000.00 කි. 3 වන කාර්තුව වන විට1.7% ක් ද 4 වන කාර්තුව වන විට 49.9% ක් වැය කරමින් වර්ෂ අවසානයේදී 50% ක මූල්‍ය ප්‍රගතියක් ලබා ඇත.

වැය ශිර්ෂ 261-1-1-0-2401 දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධනය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය කාර්ය මණ්ඩලය සඳහා රු.900,000.00 ක ශුද්ධ ප්‍රතිපාදනයක් ලැබී ඇත. 2015 ක්‍රියාකාරී සැලැස්මට අනුව සැලසුම් කර තිබුනේ පළමු කාර්තුව තුළ 10% ක් ද 2 වන කාර්තුව වන විට 50% ක් ද 3 වන කාර්තුව වන විට 80% ක් හා 4 වන කාර්තුව වන විට 100% ක් වැය කිරීමටයි. සත්‍ය වියදම අනුව බලන විට දෙවන කාර්තුව වන විට 3.4%ක් ද තුන්වන කාර්තුව වන විට 4.7% ක් හා හතරවන කාර්තුව වන විට 62% ක් වැය කරමින් 2015 වර්ෂය අවසානයේ 62% ක මූල්‍ය ප්‍රගතියක් හිමි කරගෙන ඇත.

වැය ශිර්ෂ 261-1-2-0-2401 ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය කාර්ය මණ්ඩලයේ දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධනය සඳහා රු. 1,100,000.00 ක ශුද්ධ ප්‍රතිපාදනයක් ලැබී ඇත. 2015 ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කරමින් තුන්වන කාර්තුව වන විට 27.2% ක් ද හා හතර වන කාර්තුව වන විට 96.8% ප්‍රගතියක් අත් කර ගනිමින් 2015 වර්ෂය අවසානයේ 96.8 % ක මූල්‍ය ප්‍රගතියක් හිමි කරගෙන ඇත.

**<u>පුනරාවර්තන වියදම සංයුතිය - 2015 වර්ෂය</u>**
**<u>ප්‍රාදේශිය ලේකම් කාර්යාල</u>**

| වැයවිස්තරය | සත්‍යවියදමරු. |
|---|---|
| පුද්ගලපඩිනඩි | 849,790,070 |
| ගමන්වියදම් | 16,294,703 |
| සැපයීම් | 16,646,864 |
| නඩත්තුවියදම් | 11,244,668 |
| සේවා | 34,980,643 |
| මාරුකිරීම් | 10,951,553 |
| **එකතුව** | **939,908,501** |




2015 වර්ෂයේ වැඩසටහන අනුව ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලැබී තිබූ ශුද්ධ ප්‍රතිපාදනය සහ දරණ ලද වියදම පහත සඳහන් පරිදිය.

| විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය | මුළු වියදම |
|---|---|---|
| පුනරාවර්තන වියදම | 1,042,300,000 | 1,037,712,893 |
| මූලධන වියදම් | 78,000,000 | 47,281,223 |
| **එකතුව** | **1,120,300,000** | **1,084,994,116** |

## 4.1.2 ග්‍රාම නිළධාරි කටයුතු

ගාල්ල දිස්ත්‍රික්කයේ පරිපාලන ව්‍යුහයට අනුව ග්‍රාම නිළධාරි වසම් 896 ක් ඇත. 2015.12.31 දිනට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස අනුව සිටින ග්‍රාම නිළධාරී සංඛ්‍යාව හා පුරප්පාඩු සංඛ්‍යාව පහත සඳහන් පරිදිය.

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රාම නිළධාරී වසම් ගණන | සේවයේ නියුතු ග්‍රාම නිලධාරීන් සංඛ්‍යාව | ග්‍රාම නිලධාරීන් පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| කඩවත් සතර | 50 | 47 | 03 |
| තවලම | 36 | 34 | 02 |
| නියාගම | 34 | 32 | 02 |
| අම්බලන්ගොඩ | 36 | 35 | 01 |
| කරන්දෙණිය | 40 | 39 | 01 |
| ඇල්පිටිය | 51 | 48 | 03 |
| නෙළුව | 34 | 34 | 00 |
| නාගොඩ | 53 | 52 | 01 |
| බලපිටිය | 52 | 51 | 01 |
| හික්කඩුව | 97 | 96 | 01 |
| අක්මීමණ | 63 | 62 | 01 |
| බෙන්තොට | 51 | 48 | 03 |
| හබරාදුව | 59 | 57 | 02 |
| බද්දේගම | 70 | 69 | 01 |
| යක්කලමුල්ල | 44 | 39 | 05 |
| බෝපේ පෝද්දල | 44 | 40 | 04 |
| වැලිවිටිය | 20 | 18 | 02 |
| ඉමදූව | 43 | 40 | 03 |
| ගෝනපිනූවල | 19 | 18 | 01 |
| **එකතුව** | **896** | **859** | **37** |

## 4.1.3 අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රගතිය - 2015

2015 වසර තුළදී විගණන විමසුම් 85 ක් ලැබී ඇති අතර එයින් 46 ක් සඳහා විගණකාධිපති වෙත පිළිතුරු යවා ඇත. ඉතිරි 39 සඳහා 2016 වර්ෂයේදී කටයුතු කරනු ලැබේ.

දිස්ත්‍රික් ලේකම්ගේ කමිටු සභාපතිත්වයෙන් යුතුව විගණන කළමනාකරණ කමිටු කාර්තු රැස්වීම් පහත සඳහන් දිනවල පවත්වා ඇත .

| කාර්තුව | රැස්වීම පැවැත්වූ දිනය | වාර්තා යැවූ දිනය |
|---|---|---|
| පළමු | 2015.04.06 | 2015.06.05 |
| දෙවන | 2015.07.14 | 2015.09.07 |
| තෙවන | 2015.10.15 | 2015.12.07 |
| සිව්වන | 2015.12.28 | 2016.02.16 |

2015 වර්ෂය තුළදී ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඊට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 න් 17 ක අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් සිදු කර ඇත.

උක්ත දින වල පවත්වන ලද විගණන කළමණාකරණ කමිටු රැස්වීම් වල වාර්තා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්ට පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.

## 4.1.4.විමර්ශන හා මෙහෙයුම් ඒකකයේ ප්‍රගතිය - 2015

මෙම අංශය මගින් රජයේ නිලධාරීන් ගේ විනය කඩවීම් සම්බන්ධයෙන් මූලික විමර්ශන පවත්වන අතර කාර්යාල කටයුතු වල අඩුපාඩු සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වනු ලබයි.

ඒ අනුව 2015 වර්ෂයේ මූලික විමර්ශන 8 ක වැඩ අවසන් කර ඇති අතර පරීක්ෂණ 11 ක් පවත්වා වැඩ අවසන් කර ඇත. මූලික විමර්ශන 5 ක හා පරීක්ෂණ 5 ක කටයුතු සිදු කරමින් පවතී.

### 4.1.5 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් 'බී' ගිණුම - 2015

2015 වර්ෂය සඳහා රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් 'බී' ගිණුමේ සීමා සහ සත්‍ය වියදම පහත සඳහන් පරිදි වේ.

| | උපරිම වියදම් සීමාව (රු:ශත) | අවම ලැබීම් සීමාව (රු:ශත) | උපරිම හර ශේෂ සීමාව (රු:ශත) |
|---|---|---|---|
| 2015වර්ෂයේ ඇස්තමේන්තුව අනුව අනුමත සීමාව | 65,720,000.00 | 55,720,000.00 | 225,000,000.00 |
| 2015 වර්ෂයේ සත්‍ය අගයන් | | | |
| 261011 | 64,800,463.50 | 60,654,080.93 | |
| 261012 | 8,829,231.50 | 12,042,121.50 | 204,986,415.06 |

### 4.1.6 ගාල්ල දිස්ත්‍රික් ලේකම් විසින් එක් රැස් කරන ලද ආදායම - 2015 වර්ෂය

දිස්ත්‍රික්කය තුළ ඇති රජයට අයවිය යුතු ආදායම්, රජයේ නියෝජිතයා වශයෙන් නියමිත පරිදි නියමිත වේලාවට එක්රැස් කර දීම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වගකීමක් වනු ඇත. ඒ යටතේ එක් එක් දෙපාර්තමේන්තු වලට අදාළ ආදායම් එක් රැස් කර මාසිකව අදාළ ආදායම් ගණන් දීමේ නිලධාරීන් වෙත බැර වාර්තා මගින් නිවේදනය කොට ඇති අතර මාසික ගිණුම් සාරාංශ මගින් අදාල ආදායම් මහා භාණ්ඩාගාරයට නිවේදනය කර ඇත. ඒ අනුව 2015 වර්ෂය තුළ එක්රැස් කරන ලද ආදායම් පිළිබඳ තොරතුරු පහත සඳහන් පරිදි වේ.

| ආදායම් ශීර්ෂය | ආදායම් ගණන් දීමේ නිලධාරි | විස්තරය | 2015 වර්ෂය තුළ එක්රැස් කළ ආදායම රු:ශත |
|---|---|---|---|
| 10-03-07-02 | රෙජිස්ට්‍රාර් ජනරාල් | ලියාපදිංචි කිරීමේ ගාස්තු | 26,766,963.71 |
| 10-03-07-03 | වන සංරක්ෂණ | පෞද්ගලික දැව ප්‍රවාහනය | 1,121,187.88 |
| 10-03-07-05 | රාජ්‍ය ආරක්ෂක ලේකම් | රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට අදාළ බලපත්‍ර ගාස්තු | 159,160.00 |
| 10-03-07-99 | ස්වදේශ කටයුතු ලේකම් | අනෙකුත් බලපත්‍ර ගාස්තු | 6,287,786.62 |
| 20-02-01-01 | රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් | රජයේ ගොඩනැගිලි කුලී | 1,265,072.42 |
| 20-02-02-99 | රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් | පොළිය - වෙනත් | 8,648,948.46 |
| 20-03-02-03 | පුදුගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් | පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත යටතේ ගාස්තු | 45,050.00 |
| 20-03-02-13 | විභාග කොමසාරිස් ජනරාල් | විභාග හා අනෙකුත් ගාස්තු | 146,651.00 |
| 20-03-02-14 | මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් | මෝටර් රථ ප්‍රවාහන පනත යටතේ ගාස්තු | 58,709,060.00 |
| 20-03-02-99 | රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් | විකුණුම් හා ගාස්තු - විවිධ | 1,042,426.31 |
| 20-03-99-00 | රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් | විකුණුම් හා ගාස්තු - අනෙකුත් | 18,178,545.87 |
| 20-04-01-00 | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ | සමාජ සංරක්ෂණ දායක මුදල් | 41,872,381.18 |
| | | එකතුව | **164,243,233.45** |




ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් දිස්ත්‍රික්කය තුළ ඇති රජයට අයවිය යුතු ආදායම්, මෙසේ ආදායම් ශීර්ෂ 12 ක් ඔස්සේ එකතු කර අදාළ ආදායම් ගණන් දීමේ නිලධාරීන් වෙත මාසික බැර වාර්තා මගින් වාර්තා කර ඇත. මෙම ආදායම් ශීර්ෂ වලින් මා විසින් ඇස්තමේන්තු සකස් කරනු ලබන්නේ ස්වදේශ කටයුතු ලේකම්ගේ, රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ සහ වන සංරක්ෂකගේ ආදායම් ශිර්ෂ සම්බන්ධයෙන් පමණි.

2015 ඇස්තමේන්තු ගත ආදායම් ඉලක්කයන් පවා අභිබවා යමින් ආදායම් රැස් කිරිමට ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සමත් වී ඇති බව පහත සටහන තුළින් මනාව පැහැදිලි වේ

| ආදායම් ශීර්ෂය | 2015 ඇස්තමේන්තු ගත ආදායම රු. ශත | මූල්‍යමය කාර්ය සාධනය රු: | | |
|---|---|---|---|---|
| | | 2015 වර්ෂය තුළ රැස් කරන ලද ආදායම් රු. ශත | පසුගිය වර්ෂය තුළ (2014) රැස් කරන ලද ආදායම රු. ශත | හිඟ ආදායම 2015.12.31 රු ශත |
| 10-03-07-02 | - | 26,766,963.71 | 33,857,350.00 | - |
| 10-03-07-03 | - | 1,121,187.88 | 1,588,082.54 | - |
| 10-03-07-05 | - | 159,160.00 | 205,480.00 | 168,100.00 |
| 10-03-07-99 | 5,425,000.00 | 6,287,786.62 | 7,931,280.78 | - |
| 20-02-01-01 | 1,085,000.00 | 1,265,072.42 | 1,169,691.54 | 86,971.11 |
| 20-02-01-02 | - | - | 280.00 | |
| 20-02-02-99 | 8,700,000.00 | 8,648,948.46 | 8,334,084.30 | - |
| 20-03-02-06 | - | - | - | - |
| 20-03-02-07 | - | - | - | - |
| 20-03-02-13 | - | 146,651.00 | 8,660,682.00 | - |
| 20-03-02-14 | - | 58,709,060.00 | 47,030,230.00 | - |
| 20-03-02-99 | 50,000,000 | 1,042,426.31 | 282,126.41 | - |
| 20-03-99-00 | 8,000,000.00 | 18,178,545.87 | 30,578,726.67 | - |
| 20-03-04-00 | - | - | 343,085,500.00 | - |
| 20-04-01-00 | - | 41,872,381.18 | 45,246,431.78 | - |

2015 වර්ෂයේ ආදායම් එක්රැස් කිරීමේ ක්‍රියාවලියේදී බලපත්‍ර නිකුත් කිරීමේ භෞතික කාර්ය සාධනයෙහි ප්‍රගතිය පහත සඳහන් පරිදිය.

| භෞතික කාර්ය සාධනය 10-03-07-99 බලපත්‍ර ගාස්තු (වෙනත්) | |
|---|---|
| විස්තරය | 2015 වර්ෂයේ නිකුත් කළ බලපත්‍ර ගණන |
| වාර්ෂික ආදායම් සහතිකය | 3698 |
| වටිනාකම් සහතික | 47 |
| බලපත්‍ර පිටපත් | - |

| භෞතික කාර්ය සාධනය 10-03-07-05 ගිනි අවි හා පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර | |
|---|---|
| විස්තරය | 2015 වර්ෂයේ නිකුත් කළ බලපත්‍ර ගණන |
| පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර | 39 |
| පුපුරණ ද්‍රව්‍ය අවසර පත්‍ර | 149 |
| ගිණි අවි බලපත්‍ර | 515 |
| ගිණි අවි ඉල්ලුම් පත්‍ර | 19 |

### 4.1.7 පොදු තැන්පත් ගිණුම

2015 වර්ෂයේ ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විවිධ තැන්පත් ගිණුම් 6 ක් ක්‍රියාත්මක වූ අතර ඒ එක් එක් ගිණුමෙහි 2015.01.01 දිනට ආරම්භක ශේෂය, වර්ෂය තුළ ලැබීම්, ගෙවීම් සහ 2015.12.31 දිනට අවසාන ශේෂය පහත සඳහන් පරිදිය.

| තැ. විවිධ ගිණුම් අංකය | 2015.01.01 දිනට ආරම්භක ශේෂය (රු:ශත) | 2015 වර්ෂය තුළ ලැබීම් (රු:ශත) | 2015 වර්ෂය තුළ ගෙවීම් (රු:ශත) | 2015.12.31 දිනට අවසාන ශේෂය (රු:ශත) |
|---|---|---|---|---|
| 6003/0/0/37/0 | 444,883,997.81 | 251,382,434.51 | 696,266,432.32 | - |
| 6000/0/0/2/0/94 | - | 52,820.50 | - | 52,820.50 |
| 6000/0/0/13/0/62 | - | 33,778,832.53 | 11,380,243.77 | 22,398,588.76 |
| 6000/0/0/14/0/9 | - | 1,400.00 | - | 1,400.00 |
| 6000/0/0/16/0/45 | - | 331,483,490.36 | 2,970,933.40 | 328,512,556.96 |
| 6000/0/0/17/0/15 | - | 71,649,964.74 | 315,116.42 | 71,334,848.32 |

## 4.1.8. රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වල වියදම් පිළිබඳ ප්‍රගතිය - 2015

261 වැය ශීර්ෂයට අදාළ ගෙවීම් හැරුණු විට ගාල්ල දිස්ත්‍රික් ලේකම් විසින් 2015 වර්ෂය සඳහා රේඛීය අමාත්‍යාංශ , දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ දරණ ලද වියදම රු. 3.699,432,638.89කි.

| වැය ශීර්ෂය | විස්තරය | ප්‍රාග්ධන වියදම රු:ශත | පුනරාවර්තන වියදම රු:ශත |
|---|---|---|---|
| 001 | ජනාධිපති කාර්යාලය | 510,181.48 | 475,548.50 |
| 101 | බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය | 7,691,951.56 | - |
| 102 | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය | - | 2,860,073.39 |
| 104 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 308,447.25 | 435,177,021.82 |
| 106 | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 6,921,000.00 | 13,096,754.02 |
| 110 | අධිකරණ අමාත්‍යාංශය | - | 11,364,999.00 |
| 111 | සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 70,542.50 | 443,908.00 |
| 112 | විදේශ කටයුතු අමාත්‍යාංශය | 8,500.00 | - |
| 114 | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාථ්‍යාංශය | 11,166,133.72 | - |
| 116 | සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය | - | 588,267.98 |
| 117 | වරාය හා මහා මාර්ග අමාත්‍යාංශය | 30,000.00 | - |
| 118 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 3,364,250.63 | 27,178,723.58 |
| 120 | ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය | 3,909,363.29 | 46,150,576.15 |
| 121 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 999,017,330.55 | 57,058,216.54 |
| 123 | නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය | 851,394,356.80 | - |
| 124 | සමාජ සේවා අමාත්‍යාංශය | 2,550,448.43 | 468,453,264.88 |
| 130 | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | 3,345,984.75 | 16,171,193.50 |
| 136 | ක්‍රීඩා අමාත්‍යාංශය | 3,871,848.28 | - |
| 140 | වතු යටිතල පහසුකම් සංවරධන අමාත්‍යාංශය | - | 336,279.50 |
| 151 | ධිවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 2,304,694.75 | - |
| 153 | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය | 65,241,328.25 | 10,216,800.26 |
| 155 | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | - | 158,333.33 |
| 157 | ජාතික සංවාද පිළිබඳ අමාත්‍යාංශය | 494,205.70 | 892,892.95 |
| 160 | පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය | 178,899.00 | - |
| 163 | සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය | 2,966,198.57 | - |
| 181 | ඵලදායීතා ප්‍රවර්ධන අමාත්‍යාංශය | - | 2,015,538.44 |
| 182 | විදේශ රැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශය | 126,598.00 | 25,866,970.44 |
| 196 | විද්‍යා හා තාක්ෂණ පර්යේෂණ අමාත්‍යාංශය | 2,441,764.32 | 710,768.38 |
| 197 | නිපුනතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | - | 105,457.32 |
| 201 | බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව | 657,896.00 | 14,182,846.76 |
| 206 | සංස්කෘතික දෙපාර්තමේන්තුව | - | 289,367.79 |
| 210 | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | - | 7,874.10 |
| 216 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | 1,005,803.65 | 13,458,538.44 |
| 217 | පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව | - | 14,146,985.85 |
| 219 | ක්‍රීඩා සංවර්ධන අමාත්‍යාංශය | 1,767,050.75 | - |
| 220 | ආයුර්වේද දෙපාර්තමේන්තුව | 32,450.00 | - |
| 227 | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | - | 15,780,012.08 |
| 252 | ජන ලේඛන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව | 1,047,163.40 | 1,275,435.84 |
| 253 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | - | 444,462,397.21 |
| 254 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | - | 3,767,616.68 |
| 255 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කොළඹ | - | 100,999.99 |
| 285 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 906,599.65 | - |

| | | | |
|---|---|---|---|
| 289 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 583,051.04 | - |
| 307 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | - | 402,981.25 |
| 326 | ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව | - | 332,674.85 |
| 327 | ඉඩම් පරිහරන ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව | 1,305,819.38 | 555,427.33 |
| 328 | මිනිස් බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව | 781,643.81 | 727,107.26 |
| 401 | සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 579,333.80 | - |
| 402 | තරුණ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය | 817,020.33 | 194,385.81 |
| 403 | ළමා කටයු රාජ්‍ය අමාත්‍යාංශය | 596,070.00 | 88,567,961.78 |
| 408 | විද්‍යා හා තාක්ෂණ පර්යේෂණ අමාත්‍යාංශය | 1,438,964.06 | 2,425,544.19 |
| | **එකතුව** | **1,979,432,893.70** | **1,719,999,745.19** |

## 4.1.9. පුහුණු කිරීම් කටයුතු පිළිබඳ ප්‍රගතිය - 2015 (වැය විෂය 261-1-1-0-2401, 261-1-2-0-2401)

| අංකය | පාඨමාලාවේ නම | සහභාගී වූ සංඛ්‍යාව | වැය කල ප්‍රතිපාදන රු.ශත |
|---|---|---|---|
| 01 | මිණුම් කටයුතු පිළිබඳ දැනුවත් කිරීම (ප්‍රා. ලේ.කා බද්දේගම) | 75 | 14,175.00 |
| 02 | ආතති කළමනාකරණය (ප්‍රා. ලේ.කා බලපිටිය) | 100 | 16,700.00 |
| 03 | නායකත්වය හා කණ්ඩායම් ගොඩනැගීම (ප්‍රා.ලේ.කා නියාගම) | 133 | 21,425.33 |
| 04 | දැවහෙළීම බලපත්‍ර පිළිබඳ දැනුවත් කිරීම ( ප්‍රා. ලේ.කානියාගම) | 39 | 9,800.00 |
| 05 | සමාජ වගකීම් ප්‍රවර්ධනය (දි.ලේ.කා) | | 21,088.00 |
| 06 | අධිකරණ කටයුතු පිළිබඳ දැනුවත් කිරීම | 80 | 30,164.75 |
| 07 | දකුණු පළාත් ගණකාධිකාරීවරුන් සඳහා සිගාස් පුහුණු වැඩ මුළුව | 116 | 56,043.40 |
| 08 | රාජ්‍ය ලේඛන කළමනාකරණය හා සංරක්ෂණ පුහුණු වැඩ මුළුව | 80 | 31,450.00 |
| 09 | ධනාත්මක චින්තන ප්‍රවර්ධන පුහුණු වැඩ මුළුව (ප්‍රා.ලේ.කා. කඩවත් සතර, ප්‍රා.ලේ.කා. බෝපෙ පෝද්දල, නාගොඩ) | 459 | 73,125.00 |
| 10 | නිලධාරීන් සඳහා අභිප්‍රේරණ පුහුණු වැඩ සටහන | 150 | 35,200.00 |
| 11 | කාර්යාල ක්‍රමහා වගකීම් සංකල්ප ( ප්‍රා. ලේ.කා නියාගම) | 76 | 14,250.00 |
| 12 | ආකල්ප වර්ධනය හා පෞරුෂත්ව සංවර්ධනය ( ප්‍රා. ලේ.කා නියාගම) | 399 | 59,195.00 |
| 13 | ආයතන සංග්‍රහය, කාර්ය පටිපාටික රීති, මුදල් රෙගුලාසි පුහුණුව (ප්‍රා.ලේ.කා බෙන්තොට, ඇල්පිටිය, කඩවත්සතර, අක්මීමණ, වැලිවිටිය, කරන්දෙණිය, බද්දේගම, අම්බලන්ගොඩ, ඉමදුව) | 1345 | 205,075.00 |
| 14 | පරිගණක හා අන්තර්ජාල භාවිතය ( ප්‍රා. ලේ.කා බෙන්තොට, නාගොඩ) | 270 | 40850.00 |
| 15 | රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය හා රජයේ ගෙවීම් පටිපාටිය ( ප්‍රා. ලේ.කා ඇල්පිටිය) | 150 | 15,450.00 |
| 16 | ග්‍රාම නිලධාරී කාර්යභාරය හා වගකීම්වයෙන් යුතුව ග්‍රාම නිලධාරී කාර්යාල ගොඩනැංවීම ( ප්‍රා. ලේ.කා ඇල්පිටිය) | 50 | 7,950.00 |
| 17 | කාර්යාල කළමනාකරණය හා හා ගොනු අපහරණය ( ප්‍රා. ලේ.කා නෙළුව, කඩවත්සතර) | 125 | 18,090.00 |
| 18 | ගිණුම් ක්‍රම පිළිබඳ දැනුවත් කිරීම ( ප්‍රා. ලේ.කා නෙළුව, බෝපෙ පෝද්දල) | 276 | 29,815.00 |
| 19 | විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම(ප්‍රා.ලේ.කා.කඩවත්සතර) | 72 | 9,070.00 |
| 20 | විනය කටයුතු පිළබඳ පුහුණුව ( ප්‍රා. ලේ.කාකඩවත් සතර, අක්මීමණ) | 187 | 27,965.00 |
| 21 | රාජ්‍ය මූල්‍ය කළමනාකරණය ( ප්‍රා. ලේ.කා වැලිවිටිය, ගෝනපීනුවල, තවලම) | 221 | 80,215.00 |
| 22 | ලිපිගොනු කළමනාකරණය ( ප්‍රා. ලේ.කා කරන්දෙණිය, යක්කලමුල්ල) | 216 | 24,695.00 |

| | | | |
|---|---|---|---|
| 23 | ව්‍යාපෘති කළමනාකරණය ( ප්‍රා. ලේ.කා කරන්දෙණිය) | 68 | 7.600.00 |
| 24 | කාල කළමනාකරණය ( ප්‍රා. ලේ.කා කරන්දෙණිය, බලපිටිය) | 161 | 23,950.00 |
| 25 | වැටුප් පරිවර්තනය ( ප්‍රා. ලේ.කා කරන්දෙණිය, ගෝනපීනුවල, තවලම) | 106 | 28,487.00 |
| 26 | ඉඩම් කටයුතු පිළිබඳ පුහුණුව ( ප්‍රා. ලේ.කා කරන්දෙණිය, හික්කඩුව) | 171 | 19,550.00 |
| 27 | කාර්යාල උපකරණ පුහුණුව ( ප්‍රා. ලේ.කා හික්කඩුව) | 50 | 4,150.00 |
| 28 | ආතති කළමනාකරණය ( ප්‍රා. ලේ.කා යක්කලමුල්ල) | 213 | 22,653.00 |
| 29 | පෞද්ගලික ලිපිගොනුකරණය ( ප්‍රා. ලේ.කා තවලම, නියාගම) | 42 | 15,100.00 |
| 30 | රජයේ ඉඩම් පුහුණුව , ග්‍රාම නිලධාරීන් සඳහා ඉඩම් කටයුතු පුහුණුව( ප්‍රා. ලේ.කා නාගොඩ, හබරාදුව) | 110 | 30,800.00 |
| 31 | වැටුප් පුහුණු පාඨමාලාව (ප්‍රා. ලේ.කා බෝපේ පෝද්දල, බෙන්තොට) | 2 | 15,000.00 |
| 32 | විදේශ අධ්‍යයන වැඩ සටහන් ( ප්‍රා.ලේ.කා. අම්බලන්ගොඩ, බෝපෙ පෝද්දල ) | 2 | 327,768.00 |
| 33 | අප ජලය ප්‍රතිචක්‍රීකරණය පිළිබඳ පුහුණු වැඩ සටහන (දි.ලේ.කා) | 1 | 10,000.00 |

මීට අමතරව කාර්මික විද්‍යාල හා වෘත්තීය පුහුණු කිරීම් ආයතනයේ පාඨමාලා හදාරන සිසුන් සඳහා 2015 වර්ෂය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් ලබා දී ඇති ප්‍රායෝගික පුහුණු වීම් සංඛ්‍යාව පහත සඳහන් පරිදිය.

| අංකය | කාර්යාලය | පුහුණුව ලැබූ සිසුන් ගණන |
|---|---|---|
| 1 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගාල්ල | 19 |
| 2 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 න් | 19 |
| | එකතුව | **38** |

## 2015 වර්ෂයේ රේඛීය අමාත්‍යාංශ ප්‍රතිපාදන මගින් කරන ලද වැඩ සටහන්

විවිධ රේඛීය අමාත්‍යාංශ දෙපාර්තමේන්තු ඔස්සේ ලැබෙන ප්‍රතිපාදන උපයෝජනය කරමින් ගාල්ල දිස්ත්‍රික්කය තුළ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් ම නියෝජනය වන පරිදි විවිධ සමාජ , ආර්ථික වැඩ සටහන් පවත්වමින් ඔවුන් දැනුවත් කිරිමේ කටයුතු සිදු කර ඇත. 2015 වසර තුළ එසේ කරන ලද වැඩ සටහන් වනුයේ,

**ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය යටතේ ගර්භනී මවුවරුන්ගේ පෝෂණ දීමනාව ලබා දීමේ වැඩ සටහන - 2015**

| ප්‍රතිලාභ ලබා දුන් මාසය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වියදම රු. ශත |
|---|---|---|
| මාර්තු | 9,459 | 18,918,000.00 |
| අප්‍රේල් | 10,347 | 20,694,000.00 |
| මැයි | 10,429 | 20,858,000.00 |
| ජුනි | 10,134 | 20,268,000.00 |
| ජූලි | 10,109 | 20,218,000.00 |
| අගෝස්තු | 9,892 | 19,784,000.00 |
| එකතුව | | **120,736,220.00** |

**ළමා දිරිය වැඩ සටහන යටතේ පෙර පාසල් ගුරුවරුන් සඳහා දීමනා ලබා දීම - 2015**

| කාලය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වියදම රු . ශත |
|---|---|---|
| ජූනි සිට සැප්තැම්බර් | 467 | 467,000.00 |
| ඔක්තෝබර් සිට දෙසැම්බර් | 473 | 354,750.00 |
| **එකතුව** | | **821,750.00** |

**ජාතික ළමා රක්ෂණ අධිකාරියේ දිස්ත්‍රික් කටයුතු**

| අනු අංකය | වැඩ සටහන | ඉලක්ක කණ්ඩායම | වැඩ සටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් | වියදම රු. |
|---|---|---|---|---|---|
| 1 | සිවිල් සංවිධාන නායකයින් දැනුවත් කිරීමේ වැඩ සටහන | ග්‍රාමීය වශයෙන් ප්‍රජාව සමඟ කටයුතු කරන නිලධාරීන් | 16 | 1000 | 360,000 |
| 2 | දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටුව | | 2 | 220 | 14,340 |
| 3 | පාසල් ළමා ආරක්ෂණ කමිටු සහිත පාසල් වල සිසුන් දැනුවත් කිරීම | පාසල් සිසුන් ,ගුරුවරුන් හා දෙමාපියන් | 19 | | 190,000 |
| 4 | ළමා නිවාස අධීක්ෂණ වැඩ සටහන | නිවාසගත දරුවන් හදිසි අනතුරු වලින් වලක්වා ගැනීම සම්බන්ධ දැනුවත් කිරීම් | 10 | | 97,000 |
| 5 | පාසල් වෑන් රථ රියදුරන් දැනුවත් කිරීම | පාසල් වෑන් රථ රිදුරන් | 01 | 150 | 20,000 |
| 6 | විද්‍යාපීය සිසුන් දැනුවත් කිරීම | ගුරු සිසුන් | 01 | 200 | 46,000 |
| 7 | සිනහ කඳුලු පෙට්ටි බෙදා දීමට සමගාමීව උපදේශන ගුරුවරුන් දැනුවත් කිරීම | උපදේශන ගුරුවරුන් | 01 | 75 | 45,510 |
| 8 | මිලියන 700 වැඩසටහනට සමගාමීව ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩ සයහන | ග්‍රාමීය ප්‍රජාව | 06 | | 60,000 |
| **එකතුව** | | | | | **832,550** |





| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | අදාළ ක්ෂේත්‍රය | ප්‍රතිලාභ ලැබූ හෝ පුහුණු වීම් ලැබූ සංඛ්‍යාව | වැය කල මුදල රු. ශත |
|---|---|---|---|
| ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය | නැවුම් කිරි ලබා දීමේ වැඩ සටහන | 4008 | 5,810,215.00 |
| | ගැහැණු දරුවාගේ ජාත්‍යන්තර දිනය | 159 | 17,030.00 |
| | මුල් ළමා විය රැකවරණය වැඩ සටහන | 12201 | 900,000.00 |
| සමාජ සුභසාධන අමාත්‍යාංශය | ඖෂධ ආධාර ලබා දීම | 8 | 90,449.00 |
| | ආබාධ සහිත පුද්ගලයන් සඳහා ස්වයං රැකියා ආධාර | 41 | 450,900.00 |
| | ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා රු.2000.00 දීමනාව ලබා දීම | 22967 | 407,982,000.00 |
| | තනි මාපිය පවුල් ස්වයං රැකියා ආධාර | 24 | 366,570.00 |
| | දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල සාමාජිකයින් දැනුවත් කිරීම | 60 | 25,000.00 |
| | ජාත්‍යන්තර වැඩිහිටි දිනය සැමරීමේ ප්‍රාදේශීය උත්සව 19 සඳහා | 1615 | 161,500.00 |
| | අබාධ සහිත පුද්ගල නිවාස ආධාර | 14 | 1,850,000.00 |
| | ආබාධිත පුද්ගල ජීවනාධාර දීමනාව (රු.3000.00) | 1498 | 52,701,000.00 |
| | අධ්‍යාපන ආධාර ලබා දීම | 180 | 274,750.00 |
| | වැඩිහිටියන් දැනුවත් කිරීමේ වැඩ සටහන් සඳහා | 2853 | 427,500.00 |
| | ප්‍රාදේශීය ළමා සංවර්ධන කමිටු | 85 | 90,000.00 |
| | කැපකරු දෙගුරු ආධාර වැඩ සටහන | 123 | 738,000.00 |
| | වෛද්‍ය හා පෝෂණ ආධාර | 12 | 70,000.00 |
| | පාසල් උපකරණ හා අධ්‍යාපන ආධාර | 595 | 833,500.00 |
| පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව | ලෝක ළමා දින වැඩ සටහන් | 19 | 95,000.00 |
| | ළමා මිතුරු ආදර්ශ ගම්මාන | 253 | 191,830.00 |
| | නිවුන් දරු ආධාර | 50 | 187,500.00 |
| | පාසල් නොයන ළමුන් පාසල් ගත කිරීම | 375 | 14,400.00 |
| තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | සබන් නිෂ්පාදනය | 67 | 10385.00 |
| | LED බල්බ් සහ නාම පුවරු නිෂ්පාදනය | 486 | 907,555.25 |
| | බිම් මල් නිෂ්පාදනය | 249 | 40,301.00 |
| | කිරි ආශ්‍රිත නිෂ්පාදන | 227 | 46,271.10 |
| | හඳුන්කූරු, ඉටි පන්දම් නිෂ්පාදනය | 259 | 40,402.50 |
| | කුළු බඩු නිෂ්පාදනය | 43 | 2,523.00 |
| | සේදුම් කාරක දියර නිෂ්පාදන | 119 | 18,722.00 |
| | කෑම වර්ග නිෂ්පාදනය | 1,171 | 170,382.01 |
| | කොසු, ඉදල් නිෂ්පාදන | 128 | 12,470.00 |
| | පාවහන් නිෂ්පාදන | 3,773 | 82,559.00 |
| | බෑග් පාපිසි නිෂ්පාදන | 487 | 113,890.70 |
| | තාක්ෂණ පැවරුම් වැඩ සටහන | 653 | 78.724.25 |
| | අලෙවිකරණය/ඇසුරුම්කරණය | 142 | 11,191.00 |
| | විසිතුරු මල් වගාව | 4378 | 58,977.00 |
| | ආහාර ද්‍රව්‍ය විජලනය | 75 | 5,045.00 |
| | ස්ක්‍රීන් ප්‍රින්ටින්/ග්‍රැෆික් නිර්මාණ | 106 | 20,441.00 |

| | | | |
|---|---|---|---|
| | ගම් වර්ග නිෂ්පාදනය | 46 | 6,656.00 |
| | දිස්ත්‍රික් ප්‍රදර්ශනය | 655 | 181,250.00 |
| | බතික් නිෂ්පාදන | 100 | 27,954.50 |
| | මහන මැෂින් අළුත්වැඩියාව | 275 | 100,121.00 |
| | දූරකථන අළුත්වැඩියාව | 188 | 49,473.50 |
